**03. සැබෑ ලෝකයේ කාන්තාවකගේ චිත්ත ස්වභාවය පබාවතියගේ චරිතයෙන් නිරූපණය වෙයි. නිදසුන් තුනක්වත් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)**

කුරුණෑගල රාජධානි සමයේ පාලිජාතකට්ඨකතාව ඇසුරු කරගෙන වීරසිංහ ප්‍රතිරාජ නම් අමාත්‍යවරයාගේ මැදිහත්වීමෙන් සිංහලයට නැගුණු පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ජාතක කතා 547කින් සමන්විතය. එය කතා 550ක්ව පැවති බවට ද විද්වත් මතයක් පවතී. එහි එන 523වන කතාංගය වන කුස ජාතකය ස්ත්‍රියක් නිසා සසුනේ උකටලී වූ එක්තරා භික්ෂුවක් උදෙසා බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලදී. ස්ත්‍රීන් පිළිබඳ සිත් නිසා තේජස්වූ පුරාතනයේ නුවණත්තෝ තේජසින් පිරිහී නොයෙක් ව්‍යසනයට පැමිණීම මින් විදහා දක්වයි.

එහි එන පබවතියගේ චරිතය පාරම්පරික දෘෂ්ටිය නිරූපණය කළද සැබෑ ලෝකයේ ස්ත්‍රියකගේ චිත්ත ස්වරූපයද ඇගේ චරිතය තුළින් විදහා දැක්වෙයි. ඇය අතිශය රූමත් තරු,යකි. සීලවතී මව් බිසවගේ උපාය නිසා විරූපී කුස කුමරු සමග විවාහ වන ඇ හට දරු ගැබක් පිහිටන තෙක් දිවා කාලයේ තම සැමියා දැක ගැනීමට නොහැකි වෙයි. එහෙත් කිසිවක් නොකියා ඊට එකඟ වන ඇ තම මව්පියන්ගේ තීරණ වලට එරෙහි නොවූවාය. එකල තිබුණු සම්මතය අනුව දෙමාපියන්ගේ තීරණ වලට එරෙහි නොවීම තුළින් සැබෑ ලෝකයේ ස්ත්‍රියකගේ ස්වාභාවය ඇය තුළින් නිරූපණය වෙයි.

විවාහ ජීවිතය අඹු සැමි යුවලකගේ කායික තෘප්තිය පමණක් නොවේ. ඒ වූ කලී ජීවිතයේ දුක සැප බෙදා ගෙන නින්දා ප්‍රසංශා දරාගෙන ඒවා බෙදා හදා ගෙන ගත කරන සාමූහික සහජීවනයකි. පබාවතියට අවශ්‍ය වූයේ සැබෑ ලෝකයේ ස්ත්‍රියක මෙන් තම විවාහ දිවිය ගත කිරීමටයි. තම ස්වාමියා දහවල් කාලයේ දැක ගැනීමේ ආශාව ඇ තුළ පැනණැගීම ස්වාභාවිකය. එහිදී ඇය රවටනු ලැබුවේ සීලවතී බිසව විසිනි. කුස රජ නෙළුම් පොකුණේ සැඟවී සිට දිය කෙළියට බට පබවතියගේ අත අල්ලා ගත් අවස්ථාවේ ස්පර්ශයෙන්ම ඒ කුස රජු බව වටහා ගන්නා පබාවතිය වහා කිපී තම නුවර වූ සාගල පුරයට යාමට පිටත් වෙයි. ඕනෑම ස්ත්‍රියක් මෙවන් අවස්ථාවක සිදු කරන්නේ තම මව්පියන්ගේ සහය පැතීමයි. පබාවතියද එලෙස තම මව්පියන්ගේ පිහිට පතා යයි. ඇගේ කිපීම සාමාන්‍ය ලෝකයේ ගැහැනියකගේ හැසිරීමට සමාන හැසිරීමකි.

පබවතිය සිය පුරවරයට ගිය පසුව කුස රජු ඉමහත් චිත්ත පීඩාවට පත්ව ඇය සොයා මදුරාපුරයට යයි. එහි ගොස් ඇත්හල සිට වීනා වාදනය කිරීම, කුඹලා හා එක්ව පබාවතීගේ රූපය සහිත වළං සාදා යැවීම,අරක්කැමිකම් කිරීම ආදිය සිදු කරයි. මේ සිදුවීම් කිසිවකින් පබවතියගේ සිත් ගැනීමට කුස රජතුමාට නොහැකි වෙයි. ඒ සියල්ල කෝන්තියෙන් ප්‍රතික්ෂේප කරන පබවතියගේ චරිතය මුරණ්ඩු සැර පරුෂ චරිතයක් ලෙස ජාතක කතාකරුවා නිර්මාණය කර තිබේ. එහෙත් එම හැසිරීමට මුල් වූයේ ඇය රවටා විරූපී රාජ කුමාරයෙකුට ඇය පාවා දීමයි. එලෙස බලන කළ ඇගේ හැසිරීම සාමාන්‍ය ස්ත්‍රියකගේ හැසිරීම මෙන්යැයි සිතිය හැකිය.

> **”මම මෙතැන් පටන් දිවිහිමියෙන් කයින් වචසින් මනසින් අමනාපයක් නො සිතමි, නො කරමි ඉදින් මා මෙසේ යාඥා වෙමින් සිටිය දී මට ක්ෂමා නො කොට මාගේ බස් නො පිළිගත් සේක් වී නම් දැන් මපියාණන් වහන්සේ මෙසත් රජදරුවන්ට මා සත් කඩක් කොට කපා දෙන සේක. එහෙයින් මට ක්ෂමා කොට රැක්ක මැනවැයි යාඥා කළා ය.”**

කෙසේ වුවත් කතාව අවසානයේ තමා මරණයෙන් බේරා ගත් උස රජුට දිවි හිමියෙන් ප්‍රේම කිරීමට ඇය තීරණය කරයි. මෙලෙස විවිධ සිදුවීම් වලදී ඇය ගේ හැසිරීම නිරීක්ෂණය කළ විට සැබෑ ලෝකයේ ස්ත්‍රියකගේ හැසිරීම, චිත්ත ස්වාභාවය ඇගේ චරිතය තුළින් විදහා දැක්වෙන බව තීරණය කළ හැක.

Hasitha hettiarachchi
071-9020298